# ශ්‍රී ලාංකේය ජන සමාජයේ පුද්ගල අපගාමී චර්යා වර්ධනය විෂයෙහි දෘශ්‍ය රූප සහිත ගීත (Visual Songs) මගින් සිදු කෙරෙන බලපෑම පිළිබඳ විමර්ශනයක්

සංඛපාලේ පඤ්ඤාසාර හිමි[1]

මෙහොතක් පාසා සිදු වන විවිධ අපරාධ සඳහා පුද්ගල අපගාමී චර්යා බොහෝ සෙයින් හේතු වන බව නීති විසාරදයන්ගේ මෙන් ම මානව හා අපරාධ විද්‍යාඥයන්ගේ ද පිළිගැනීමයි. අපගාමී චර්යා යනු පුද්ගලයා අයහපතට යොමු කරවන චර්යාවන් ලෙස සරලව හඳුන්වාදිය හැකිය. සමාජයේ පැවතිය යුතු යැයි සම්මත ක්‍රියාවන්ගෙන් මිනිසා තොර වූ විට නොයෙකුත් සමාජ ප්‍රශ්න උද්ගත වේ. එක් සාමාජිකයෙකුගේ ක්‍රියාව අනෙක් සාමාජිකයන් කෙරෙහි බලපානු ලබයි. අප නිරන්තරයෙන් ම කටයුතු කළ යුත්තේ අන්‍යයන් කෙරෙහි සැලකිල්ලෙනි. යම් පුද්ගලයෙකු තුළ අපගාමී චර්යාවන් ක්‍රියාත්මක වන්නේ ද එමගින් ඔහු ජීවත්වන සමාජයට විශාල බලපෑමක් ඇති වේ. පුද්ගල අපගාමී චර්යා පිළිබඳ නූතන මනෝවිද්‍යාවේදී විශේෂ අවධානයක් යෙමු කෙරෙන්නේපුද්ගල අපගාමී චර්යා මගින් කෙරෙන පුද්ගල හා සමාජ හානිය අවම කරගැනීම සඳහාය.

පුද්ගලයා අපගාමී චර්යා කෙරෙහි යොමු කෙරෙන සාධක රාශියකි. කාලාන්තරයක් මුලුල්ලේ යටි සිතෙහි තැන්පත්ව තිබූ අපගාමී සිතිවිලි, පාරිසරික සාධක මෙන්ම ආරයෙන් කෙරෙන බලපෑම් ආදිය ඒ අතර වේ. පාරිසරික සාධකය යටතට සෞන්දර්යය සිතිවිලි ද අයත්වේ. පුද්ගල භාවාත්මක පැතිකඩ කෙරෙහි ඍජු ලෙසම සෞන්දර්යයේ බලපෑම සිදු වේ. නූතන ශ්‍රී ලංකාවේ සෞන්දර්යය ක්ෂේත්‍රයට අයත් දෘශ්‍ය රූප සහිත ගීතවලට ඉහළ ජනප්‍රියත්වයක් හිමි වේ. ගීතයට අදාළ දෘශ්‍ය රූප ඉදිරිපත් කිරීම නිසා රසික සිත් වැඩිදුරටත් ප්‍රීනනයට පත්වේ. ගීතය මගින් ඉදිරිපත් කෙරෙන සමාජ විවරණය මැනවින් ප්‍රේක්ෂක ජනතාවට සමීප කිරීමේ අවස්ථාව දෘශ්‍ය රූප සහිත ගීතවලට හැකිය. ගීතය බොහෝ දුරට සමාජ යහපත අරමුණු කරගනිමින් නිර්මාණය වන්නකි.

රූපවාහිනියෙන් මෙන් ම සංයුක්ත තැටි හා විවිධ දත්ත හුවමාරු කිරීමේ උපකරණ මගින් නූතනයේ බහුල වශයෙන් දෘශ්‍ය රූප සහිත ගීත විකාශනය කෙරේ. මගී ප්‍රවාහණ බස්රථවල බහුල වශයෙන් දක්නට ලැබෙන්නේ එම ගීතයන්ය. නූතනයේ විකාශයවන බොහෝ දෘශ්‍ය රූප සහිත ගීත පුද්ගලයා අපගාමී චර්යා සඳහා යොමු කිරීම විසයෙහි මූලිකවන බව පෙනේ. ආදර සබඳතා බිඳ වැටීම, විවහා සබඳතා බිඳ වැටීම මෙන් ම විවිධ සමාජ ගැටලු දෘශ්‍ය රූපමගින් නිරූපණය කිරීමේදී බොහෝ දුරට සිය දිවි නසා ගැනීම, විරුද්ධ පර්ශවයනට හිංසා කිරීම, විරුද්ධ පාර්ශවය ඝාතනය කිරීම, ස්වකීය ජීවිතයට පීඩා කරගැනීම, විවිධ සමාජ දුරාචාර ක්‍රියාවන්ට යොමු වීම (සුරාවට, සූදුවට සමාජ ශාලා ඇසුරට හුරු වීම, පිරිස් අතහැර හුදෙකලා වීම, සමාජයේ සමස්ත කාන්තාවන්ට හෝ පුරුෂයන්ට වෛර කිරීම) ආදී සිදුවීම් බහුල වශයෙන් දැකගත හැකිය. මෙම ක්‍රියාවන්ගෙන් බොහෝමයක් අපගාමී චර්යාවන් ගනයට වැටේ.දෘශ්‍ය රූප සහිත ගීත කෙතෙක් දුරට අපගාමී චර්යාවන් සඳහා පුද්ගලයා යොමු කරන්නේ ද යන්න මෙමගින් පර්යේෂණයට භාජනය කොට ඇත.

**ප්‍රමුඛ පද** : දෘශ්‍ය රූප සහිත ගීත, අපගාමී චර්යා, සමාජ ගැටලු, සෞන්දර්යය,

1 සහය කථිකාචාර්ය, පාලි හා බෞද්ධ අධ්‍යයනාංශය, ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය
sankhapala1984@gmail.com

ාධක රාශියකි. කාලාන්තරයක් මුලුල්ලේ යටි සිතෙහි තැන්පත්ව තිබූ අපගාමී සිතිවිලි, පාරිසරික සාධක මෙන්ම ආරයෙන් කෙරෙන බලපෑම් ආදිය ඒ අතර වේ. පාරිසරික සාධකය යටතට සෞන්දර්යය සිතිවිලි ද අයත්වේ. පුද්ගල භාවාත්මක පැතිකඩ කෙරෙහි ඍජු ලෙසම සෞන්දර්යයේ බලපෑම සිදු වේ. නූතන ශ්‍රී ලංකාවේ සෞන්දර්යය ක්ෂේත්‍රයට අයත් දෘශ්‍ය රූප සහිත ගීතවලට ඉහළ ජනප්‍රියත්වයක් හිමි වේ. ගීතයට අදාළ දෘශ්‍ය රූප ඉදිරිපත් කිරීම නිසා රසික සිත් වැඩිදුරටත් ප්‍රීනනයට පත්වේ. ගීතය මගින් ඉදිරිපත් කෙරෙන සමාජ විවරණය මැනවින් ප්‍රේක්ෂක ජනතාවට සමීප කිරීමේ අවස්ථාව දෘශ්‍ය රූප සහිත ගීතවලට හැකිය. ගීතය බොහෝ දුරට සමාජ යහපත අරමුණු කරගනිමින් නිර්මාණය වන්නකි.

රූපවාහිනියෙන් මෙන් ම සංයුක්ත තැටි හා විවිධ දත්ත හුවමාරු කිරීමේ උපකරණ මගින් නූතනයේ බහුල වශයෙන් දෘශ්‍ය රූප සහිත ගීත විකාශනය කෙරේ. මගී ප්‍රවාහණ බස්රථවල බහුල වශයෙන් දක්නට ලැබෙන්නේ එම ගීතයන්ය. නූතනයේ විකාශයවන බොහෝ දෘශ්‍ය රූප සහිත ගීත පුද්ගලයා අපගාමී චර්යා සඳහා යොමු කිරීම විසයෙහි මූලිකවන බව පෙනේ. ආදර සබඳතා බිඳ වැටීම, විවහා සබඳතා බිඳ වැටීම මෙන් ම විවිධ සමාජ ගැටලු දෘශ්‍ය රූපමගින් නිරූපණය කිරීමේදී බොහෝ දුරට සිය දිවි නසා ගැනීම, විරුද්ධ පර්ශවයනට හිංසා කිරීම, විරුද්ධ පාර්ශවය ඝාතනය කිරීම, ස්වකීය ජීවිතයට පීඩා කරගැනීම, විවිධ සමාජ දුරාචාර ක්‍රියාවන්ට යොමු වීම (සුරාවට, සූදුවට සමාජ ශාලා ඇසුරට හුරු වීම, පිරිස් අතහැර හුදෙකලා වීම, සමාජයේ සමස්ත කාන්තාවන්ට හෝ පුරුෂයන්ට වෛර කිරීම) ආදී සිදුවීම් බහුල වශයෙන් දැකගත හැකිය. මෙම ක්‍රියාවන්ගෙන් බොහෝමයක් අපගාමී චර්යාවන් ගනයට වැටේ.දෘශ්‍ය රූප සහිත ගීත කෙතෙක් දුරට අපගාමී චර්යාවන් සඳහා පුද්ගලයා යොමු කරන්නේ ද යන්න මෙමගින් පර්යේෂණයට භාජනය කොට ඇත.

**ප්‍රමුඛ පද :** දෘශ්‍ය රූප සහිත ගීත, අපගාමී චර්යා, සමාජ ගැටලු, සෞන්දර්යය, ප්‍රේක්ෂකයා

1 සහය කථිකාචාර්ය, පාලි හා බෞද්ධ අධ්‍යයනාංශය, ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය
sankhapala1984@gmail.com